**30-01-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මුළු කල්පයෙන්ම උතුම්ම උතුම් වූ යුගය වන්නේ මෙම සංගම යුගයයි. මෙම යුගයේදී ඔය දරුවන් සැකරීනය සිහි කර සතෝප්‍රධාන් වෙනවා.

**ප්‍රශ්නය:** ප්‍රශ්න රාශියක් මතු වීමට හේතුව කුමක්ද ඒ ප්‍රශ්න වලට විසඳුම කුමක්ද?

**පිළිතුර:** ගැටළුවක් ඇති වන්නේ ශාරීරික අවධානය ඇති විටයි. ඒ නිසා ප්‍රශ්න රාශියක් මතු වෙනවා. බාබා කියනවා : දරුවනි, මා විසින් ඔබට දී ඇති තමනුත් පාරිශුද්ධ වී අන් අයවත් පාරිශුද්ධ කරවීමේ රාජකාරියේ නිරත වන්න. සියලුම ප්‍රශ්න අවසන් වී යාවි.

**ගීතය:** ඔබ ලැබීමෙන් අප මුළු ලොවම ලැබුවෙමු. අහසත් පොළොවත් සියල්ල අයිති අපටයි.

ඕම් ශාන්ති. සුමිහිරිතම ආධ්‍යාත්මික දරුවනි, ඔබලාට ගීතය ඇසුණා. සුමිහිරිතම ආධ්‍යාත්මික දරුවනි කියා කිව්වේ කවුද? අනිවාර්යෙන්ම ආධ්‍යාත්තමික පියා විය යුතුයි. සුමිහිරිතම, ආධ්‍යාත්මික දරුවනි කියා කිව්වේ කවුද? අනිවාර්යෙන්ම ආධ්‍යාත්මික පියා විය යුතුයි. සුමිහිරිතම ආධ්‍යාත්මික දරුවනි, ඔබලා දැන් අසුන් ගෙන සිටින්නේ පරමාත්ම පියා ඉදිරියේමයි. ඔහු මහත්වූ සෙනෙහසකින් ඔබට සියල්ල පහදා දෙනවා. මෙම ලෝකයේ කිසිම මනුෂ්‍යයෙක්ට. පරමාත්ම පියාම හැරෙන්න වෙන කිසිම කෙනෙක්ට ලෝ වැසියන්ට සාමය හා සතුට දානය කර ඔවුන්ව දුකින් මුදවා ගන්න බැහැ. මෙන්න මේ නිසා තමයි ඔබ දුක් විඳින අවස්ථා වලදී නිතරම පරමාත්ම පියාව සිහිපත් කරන්නේ. ඔය දරුවන් පරමාත්ම පියා ඉදිරියේම අසුන් ගෙන සිටිනවා. බාබා ඔබලාව සතුටු දේශයට සුදුස්සන් බවට පත් කරවනා බව ඔබලාට තේරෙනවා. අඛණ්ඩ සතුටු දේශයේ පාලකවරුන් බවට ඔබලාව පත් කරවනා පරමාත්ම පියා ඉදිරියටම ඔබලා දැන් පැමිණ සිටින්නේ බාබා ඉදිරියේම අසුන්ගෙන කෙළින්ම ඔහුට ඇහුම් කන්දීමත් දුර බැහැරක සිට ඇහුම්කන් දීමත් අතර විශාල වෙනසක් ඇති බව ඔබලා දැන් අවබෝධ කර ගෙන සිටිනවා. ඔබ මධුබන් පැමිණෙන්නේ කෙළින්ම ඔහුව මුණ ගැසීමටයි. මධුබනය සෑම කෙනෙක්ම දන්නවා. මිනිස්සු ක්‍රිෂ්ණාගේ රූපයක් මධබන්හි පෙන්වා තිබෙනවා. කෙසේවෙතත්, මධුබන් වල ක්‍රිෂ්ණා නැහැ. මේ සඳහා උත්සාහයක් අවශ්‍ය බව ඔය දරුවන් දැන් තේරුම්ගෙන සිටිනවා. ඔබ නිතර නිතරම තමන් ජීවාත්ම සත්තාවක් කියා සැලකිය යුතුයි. ජීවාත්මයක් වන මම මගේ උරුමය පරමාත්ම පියාගෙන් දිනා ගන්නවා. මුළු කල්පයටම පරමාත්ම පියා පැමිණෙන්නේ එකම එක වතාවයි. මුළු කල්පයෙන්ම ඉතාමත් සුන්දර යුගය මෙම සංගම යුගයයි. උතුම්ම උතුම් යුගය කියාත් එය හඳුන්වනවා. සෑම මනුෂ්‍යයක්ම උතුම් අයෙක් බවට පත් කරවන්නේ මෙම සංගම යුගයේදීයි. දැනට සියළුම මානව ජීවාත්මයන් තමෝප්‍රධාන්ය. දැන් ඔවුන් සතෝප්‍රධාන් වෙමින් සිටිනවා. සතෝප්‍රධාන් වුණු විට ඔබලා උතුම් අයවළුන් වේ. මිනිසුන් තමෝප්‍රධාන් වුණු විට ඔවුන් පරිහානිකාරී වෙනවා. ඉතින් දැන් පරමාත්ම පියාම පැමිණ ඔය ජීවාත්මයන්ට කරුණු කාරණා පහදා දෙනවා. මුළු චරිත කොටසම රඟදක්වන්නේ ජීවාත්මයයි. ශරීරය නොවෙයි. ඔය ජීවාත්මයන් මුලින්ම අශාරීරික ලෝකයේ, ශාන්ත දේශයේ සිටි අය බව ඔබලාගේ සිහියේ දැන් තිබෙනවා. කිසිම කෙනෙක් මෙය නොදන්නා අතර වෙනත් කිසිම කෙනෙක්ට එය පැහැදිලි කර දෙන්නත් බැහැ. ඔබලාගේ බුද්ධියේ අගුළු දැන් විවර වෙලා. ජීවාත්මයන් සැබවින්ම උත්තරීතර දනව්වේ වාසය කරනා බව ඔබලා දන්නවා. එය අශාරීරික ලෝකයයි. මෙය ශාරීරික, භෞතික ලෝකයයි. ජීවාත්මයන් වන අප සෑම කෙනෙක්ම මෙහිදී නළුවන්ය. පළමුවෙන්ම අපගේ චරිත කොටස රඟදැක්වීමට පැමිණෙන්නේ අපියි. පසුව අන් සෑම කෙනෙක්ම ක්‍රම ක්‍රමයෙන් පහළට පැමිණෙනවා. සෑම නළුවෙක්ම එකම වෙලාවට පැමිණෙන්නේ නැහැ. සෑම වර්ගයකටම නළුවන් දිගින් දිගටම පැමිණෙනවා. ඔබ සෑම කෙනෙක්ම එකට එකතු වීමට පැමිණෙන්නේ ජවනිකාව රඟදක්වා අවසන් වුණු විටයි. ඔබලා මුලින්ම සාම දේශයේ වැසියන් වන බවත් පසුව තම තමන්ගේ චරිත කොටස් රඟදැක්වීමට ඔබලා පහළට පැමිණි බවත් පිළිබඳ වූ ඥානය ඔබලාට දැන් දීලයි තිබෙන්නේ. පරමාත්ම පියා තම චරිතය රඟදැක්වීමට මුළු කාලයටම පැමිණෙන්නේ නැහැ. සම්පූර්ණ කාලයම ගන්නේ ජීවාත්මයන් වන අප පමණයි. එයින් සතෝප්‍රධාන් අප තමෝප්‍රධාන් වෙනවා. ඔහුටම කෙළින්ම ඇහුම්කන් දී ඔය දරුවන් දැන් විශාල වින්දනයක් ලබනවා. මුරලිය කියවීමෙන් පමණක් ඔබලා එතරම් වින්දනයක් ලබන්නේ නැහැ. මන්ද ඔබ දැන් සිටින්නේ බාබා ඉදිරියේමයි. දෙවි දේවතාවරුන්ගේ භූමියක් ලෙස පැවති භාරතය දැන් තවදුරටත් එසේ නොවනා බව ඔය දරුවන් අවබෝධ කර ගෙන සිටිනවා. ඔබට ඔවුන්ගේ රූප දැක ගත හැකියි. සැබවින්ම ඒවා තිබුණා. අපි එතැන සිටි අයයි. මුලින්ම

අප දේවතාවරුනුයි. ඔබගේ චරිත කොටස ඔබට මතක ඇති නේද? නැතිනම් අමතක වෙලාද? පරමාත්ම පියා කියනවා: ඔබලා මෙහිදී ඔබගේ චරිත කොටස් රඟ දක්වනවා. මෙය නාටකයයි. නව ලෝකය අනිවාර්යෙන්ම පැරණි ලෝකය වෙනවා. ඔය ජීවාත්මයන් පළමුවෙන්ම ඉහළ සිට පහළට පැමිණෙන විට ඔබලා පැමිණෙන්නේ ස්වර්ණමය යුගයටයි. මේ කාලයේදී මේ සෑම දෙයක්ම ඔබගේ සිහියේ තිබෙනවා. ඔබලා ලෝක පාලකවරුන්. අධිරාජයින් හා රාජිණියන්ව සිටියා. ඔබලාට රාජ්‍යයක් තිබුණා. නමුත් ඒ රාජ්‍යය දැන් නැහැ. අධිරාජ්‍යය පාලනය කරන්නේ කෙසේද යන්න ගැන ඔබ ඉගෙන ගනිමින් සිටිනවා. එහි කිසිම උපදේශකවරයෙක් නැහැ. එහිදී කිසිම කෙනෙකුට කිසිම උපදේශයක් දීමේ අවශ්‍යතාවයක් නැහැ මන්ද ඔවුන් ඒ උතුම්ම උතුම් අය බවට පත් වන්නේ දැන් මේ කාලයේදී ශ්‍රීමත් පිළිපැදීමෙනුයි. එවිට ඔබට නැවතත් කිසිම කෙනෙකුගෙන් උපදෙස් ගැනීමට සිදු වන්නේ නැහැ. කවුරු හෝ කෙනෙකුගෙන් උපදෙස් ගැනීමට ඔවුනට සිදුවූවා නම් ඉන් අදහස් වන්නේ ඔවුන්ගේ බුද්ධිය බෙලහීන වී ඇති බවයි. මේ කාලයේදී ඔබ ලබනා ශ්‍රීමත් ස්වර්ණමය යුගයේත් පවතීවි. මුල් කල්ප භාගයේ දීම දේවතා රාජ්‍යයක් පැවති බව ඔබලා දැන් දන්නවා. ඔය ජීවාත්මයන් දැන් නව පණක් ලබමින් සිටිනවා. පරමාත්ම ජීවය හැර වෙන කිසිම කෙනෙකකුට මෙම ඥානය දිය නොහැකියි. ඔය දරුවන් දැන ජීව අවධානයට පත් විය යුතුයි. ශාන්ත දේශයේ සිට පැමිණි ඔබලා දැන් කථන දේශයට පැමිණ සිටිනවා. කථනයෙන් තොරව ඔබලාට ක්‍රියා කරන්න බැහැ. මේවා තේරුම් ගත යුතු කරුණුයි. පරමාත්ම පියා ලඟ මුළු ඥාන සම්භාරයම ඇත්තාක් සේ ඔය ජීවාත්මයන් ලඟත් මේවා තිබෙනවා. ජීවාත්මය කියනවා: මම මෙම ශරීරය අතහැර දමා මගේ සංස්කාර වලට අනුව තවත් එකක් ගන්නවා. එහි අනිවාර්යෙන්ම නැවත උපත් ගැනීම සිදු වෙනවා. තම තමන්ට ලැබී ඇති චරිත කොටස් ජීවාත්මයන් දිගටම රඟදක්වනවා. දවසින් දවසම ජීවාත්මයන්ගේ පාරිශුද්ධත්වයේ ප්‍රමාණය අඩු වී ගෙන යනවා. අපිරිසිදු යන වචනය තඹ යුගයේ සිට පැවත එන්නක්. ඒ වුණත් අනිවාර්යෙන්ම පොඩි වෙනසක් තිබෙනවා. අළුතින් නිවසක් තැනුවත් මාසයකට පසුව අනිවාර්යෙන්ම එහි වෙනසක් ඇති වේවි. බාබා තමන්ට උරුමයක් හිමි කර දෙන බව ඔය දරුවන් දැන් අවබෝධ කර ගෙන සිටිනවා. පරමාත්ම පියා කියනවා: මා පැමිණ සිටින්නේ ඔය දරුවන්ට ඔබගේ උරුමය උරුම කර දීමටයි. ඔබ සෑම කෙනෙක්ම තම තමන් දරණා උත්සාහයේ තරමට තත්ත්වයක් දිනා ගනීවි. පියා කිසිම වෙනස්කමක් කරන්නේ නැහැ. තමන් උගන්වන්නේ ජීවාත්මයන්ටයි කියා ඔහු දන්නවා. තම පරමාත්ම පියාගෙන් උරුමය දිනා ගැනීමට ජීවාත්මයන්ට අයිතියක් තිබෙනවා. ගැහැණු පිරිමි දැක්මක් මෙහි නැහැ. ඔබ සෑම කෙනෙක්ම දරුවන් වන අතර පරමාත්ම පියාගෙන් උරුමය දිනා ගනිමින් සිටිනවා. සෑම ජීවාත්මයක්ම සහෝදරවරුන්ය. පරමාත්ම පියා ඔබට උගන්වා ඔබගේ උරුමය ඔබට හිමිකර දෙනවා. පරමාත්ම පියා පමණයි තම ආධ්‍යාත්මික දරුවන්ට මෙසේ කියන්නේ: මගේ ආදරණීය, සුමිහිරිතම, බොහෝ කාලයක් තිස්සේ නැතිවී සිට මේ දැන් හමුවුණු දරුවනි, ඔබලා ඔබගේ චරිත කොටස බොහෝ කාලයක් තිස්සේ රඟපා දැන් අවසානයේ මා හමු වීමට පැමිණ සිටින්නේ ඔබගේ උරුමය දිනා ගැනීමටයි. මෙයත් නාටකයේ නියමිත වූවක්. මුල පටන්ම චරිත නියම වී තිබෙනවා. ඔය නළුවන් තම තමන්ගේ චරිත කොටස් දිගටම රඟපාමින් පැමිණෙනවා. ජීවාත්මයන් අවිනාශී වන අතර අවිනාශී චරිත කොටසක් ඔවුන් තුළ පටිගත වී තිබෙනවා. තම ශරීර මාරු කරමින් පැමිණෙන අතර ජීවාත්මයන් පිරිසිදු බවින් අපිරිසිදු වී යනවා. ජීව අපිරිසිදු වෙනවා. ස්වර්ණමය යුගයේදී ජීව පාරිශුද්ධයි. මෙය හඳුන්වන්නේ අපිරිසිදු ලෝකය කියලයි. දේවතාවරුන්ගේ රාජ්‍යය ලෙස පැවති කළ එය පාපයෙන් තොර ලෝකයකි. දැන් තව දුරටත් එය නැහැ.මෙය නාටකයකි. නව ලෝකය පැරණි වී පැරණි ලෝකය අළුත් වෙනවා. ඔබලා වෙනුවෙන් සතුටු ලෝකය ස්ථාපනය වෙමින් පවතින අතර අන් සෑම ජීවයක්ම ගිහින් මුක්ති දේශයේ නතර වෙනවා. අසීමිත නාටකය දැන් අවසානයක් කරා පැමිණෙමින් තිබෙනා අතර සෑම ජීවාත්මයක්ම එකටම මදුරු රැනක් සේ නිවහන බලා යනවා. මේ කාලයේදී මෙම අපිරිසිදු ලෝකයට පැමිණෙන ජීවාත්මයන්ගේ වටිනාකම කොයි වගේද? නව ලෝකයට යන අය තුළ පමණයි වටිනාකමක් තිබෙන්නේ. අළුත්වට තිබුණු ලෝකය දැන් නැවතත් පැරණි වෙලා බව ඔබලා දන්නවා. නව ලෝකයේදී සිටින්නේ දේවතාවරුන්ම පමණයි. එහි කිසිම ආකාරයක දුකක සඳහනක්වත් නැහැ. මෙහි ඇත්තේ පුදුමාකාර දුකක්. පරමාත්ම පියා පැමිණ ඔබලාව දුක් ලෝකයෙන් මුදවා ගන්නවා. මෙම පැරණි ලෝකය අනිවාර්යෙන්ම වෙනස් විය යුතුයි. අපි අනිවාර්යෙන්ම ස්වර්ණමය යුගයේ පාලකවරුන්ව සිට දැන් උපත් 84 ක් ගෙන පැමිණ සිටිනවා. පරමාත්ම පියා කියනවා: දැන් මා සිහි කරන්න ඔබලා දෙව්ලොව පාලකවරුන් වේවි. ඉතින් ඇයි අපි අප ජීවාත්මයන් බව සළකා පරමාත්ම පියාව සිහි නොකරන්නේ? යම් උත්සාහයක් අනිවාර්යෙන්ම දැරිය යුතුයි. අධිරාජ්‍යයක් දිනා ගැනීම එතරම් පහසු දෙයක් නොවෙයි. ඔබ පරමාත්ම පියාව සිහි කළ යුතුයි. මායා පුදුම විදියට ඔබට නිතර නිතරම අමතක කරවනවා. මේ සඳහා යම් ක්‍රමයක් සාදා ගත යුතුයි. මට අයිති වුණු පමණින් ස්මරණය ඇති වේවියි කියා

සිතන්න එපා. එසේ වුණා නම් ඔබ කුමන උත්සාහයක් දරන්නද? නැහැ: ජීවාත්ව සිටිනාතාක් කල් ඔබ උත්සාහ දරා ඥාන අමෘතය පානය කළ යුතුයි. මෙය ඔබගේ අවසන් උපත බව ඔබ තේරුම් ගෙන සිටිනවා. ශාරීරික අවධානය අතහැර දමා ජීවාත්ම අවධානයට පත් වන්න. ඔබගේ පවුලේ අය සමඟ නිවසේම ජීවත් වෙමින් අනිවාර්යෙන්ම ඔබ උත්සාහ දැරිය යුතුයි. තමා ජීවයක් බව සලකා පියාව සිහි කිරීමේ විශ්වාසයේ පමණක් සිටින්න. ඔබ තමයි මව ඔබ තමයි පියා. ඒ ගුණ සියල්ල භක්ති මාර්ගයෙන් පැමිණි ඒවායි. ඔබ කළ යුත්තේ එකම එක ඇල්ෆාව සිහි කිරීම පමණයි. එකම මිහිරි සැකරීනය මෙය පමණයි. සියල්ල අතහැර දමා එකම එක සැකරීනය (පරමාත්ම පියා) සිහි කරන්න. ඔය ජීවාත්මයන් දැන් තමෝප්‍රධාන් වෙලා. ජීවාත්මය සතෝප්‍රධාන් කරවීමට නම් ස්මරණ වන්දනාවේ නිරත වන්න. සැම කෙනෙක්ටම කියන්න: සතුටේ උරුමය පියාගෙන් දිනා ගන්න. සතුට ඇත්තේ ස්වර්ණමය යුගයේදී පමණයි. සතුටු ලෝකය ස්ථාපනය කරන්නේ බාබායි. පරමාත්ම පියාව සිහි කිරිම ඉතාමත් පහසුයි. නමුත් මායාගේ විරෝධතා රැසක් තිබෙනවා. එමනිසා, පරමාත්ම පියා වන මා සිහි කිරීමට උත්සාහ දරන්න. කහට දුරු වේවි. එක් තත්පරයකින් ජීවනමුක්තිය යන්න සඳහන් වී තිබෙනවා. ජීවාත්ම සත්තාවන් වන අප ආධ්‍යාත්මික පියාගේ දරුවන්ය. අප ඒ දේශයේ වැසියන්ය. නැවතත් අපට අපගේ චරිතය රඟදැක්වීමට සිදු වේවි. මෙම නාටකයේ දිගම චරිත වන්නේ අපේ චරිතයි. ඒ වගේම ලොකුම සතුට ලබන්නේත් අපියි. පරමාත්ම පියා කියනවා: ඔබගේ දේවතා ධර්මය ඔබට විශාල සතුටක් ගෙන දෙන්නකි. අන් සැම කෙනෙක්ම තම තමන්ගේ කර්ම ගිණුම් පියවීමෙන් අනතුරුව නිරායාසයෙන්ම ශාන්ත දේශයට යාවි. ඇයි වැඩිපුර විස්තර වලට යන්නේ? සැම කෙනෙක්වම නිවහනට ගෙන යාමට පරමාත්ම පියා පැමිණෙනවා. ඔහු මදුරු රැනක් සේ සැම කෙනෙක්වම ගෙන යනවා. ස්වර්ණමය යුගයේ සිටින්නේ සුළු පිරිසකි. මේ සියල්ල නාටකයේ තීරණය වී ඇති දේවල්ය. ශරීර විනාශ වී අවිනාශී ජීවාත්මයන් තමනගේ කර්ම පියවා නිවහන බලා ආපසු යාවි. ගින්දරට දැම්මායි කියා ජීවාත්මයන් පිරිසිදු වන්නේ නැහැ. ජීව පිරිසිදු විය යුත්තේ ස්මරණය තුළිනි. යෝග අග්නියෙනි. ඒ අග්නි යෝගාව මෙයයි. ඒ වුණත් ගින්දර මත ඇවිද්ද සීතා ගැන ඔවුන් කතාවක් හැදුවා. ගින්දරකින් කිසිම කෙනෙක්ව පාරිශුද්ධ වෙන්නේ නැහැ. පරමාත්ම පියා පැහැදිලි කර කියනවා: මේ කාලයේදී ඔය සැම සීතාවරියක්ම අපිරිසිදුයි. ඔබලා සිටින්නේ රාවන රාජ්‍යයේයි. ඒකායන පිය සිහියේ සිට ඔබලා දැන් පාරිශුද්ධ විය යුතුයි. සිටින්නේ එකම එක රාමායි. ගින්දර යන වචනය ඇසීමෙන් ඔවුන් ගින්දර මත ඇවිද්ද සීතාව සිහි කරනවා. යෝග ගින්නත් අනිත් ගින්දරත් අතර විශාල වෙනසක් තිබෙනවා. අපිරිසිදු ජීවාත්මයන් පිරිසිදු වන්නේ පරමාත්ම පියා පරමාත්ම ජීවය සිහි කිරීමෙන් පමණයි: දිවා රෑ මෙන් වෙනසක් තිබෙනවා. අපායේ දී සැම සීතාවක්ම සිටින්නේ රාවනගෙ සිර කුටියේයි. දුක් කුටියේයි. මෙහි ඇති සතුට කපුටෙකුගේ වර්චස් පිඩක් වැනියි. ඒ හා සසඳනා විට ස්වර්ණමය යුගයේ සතුට අන්ත අසීමිතයි. ඔය ජීවාත්මයන් දැන් ශිව මනමාලයා හා විවාහ ගිවිසගෙන සිටිනා නිසා ඔය ජීව ස්ත්‍රීන් වෙනවා. ශිව බාබා කියනවා: මා පමණක්ම සිහි කරන්න. ඔබ පාරිශුද්ධ වේවි. ඔබ ශාන්ත දේශයට ගොස් පසුව එතැනින් සතුටු දේශයට යනවා. එමනිසා, ඔය දරුවන් තම ඒප්‍රන ඥාන මිණිමුතු වලින් පුරවා ගත යුතුයි. කිසිම ගැටළුවක් නොතිබිය යුතුයි. ශාරීරික අවධානයට පත් වුණු විට විවිධාකාර ප්‍රශ්න මතු වෙනවා. එවිට ඔබ පරමාත්ම පියා විසින් ඔබට පවරා ඇති රාජකාරිය කරන්නේ නැහැ. ප්‍රධානම දෙය නම් ඔබ අපිරිසිදු බවින් පරිශුද්ධ විය යුතුයි. අන් සියල්ල පසෙකින් තබන්න. අධිරාජ්‍යයේ ඇති සිරිත් විරිත් ඒ ලෙසින්ම ක්‍රියාත්මක වේවි. මාළිගා තැණුනු ආකාරයෙන්ම ඒවා තැනේවි ප්‍රධානම දෙය නම් පාරිශුද්ධ වීමයි.ඔබ අහෝ පාරිශුද්ධකරුවාණනි කියා කන්නලව් කරනවා. පාරිශුද්ධ වීමෙන් ඔබ සතුටට පත් වේවි. පාරිශුද්ධම අය වන්නේ දේවතාවරුනුයි. ඔබලා දැන් උපත් 21 කට අතිපාරිශුද්ධ වෙමින් සිටිනවා. ඔවුන් පාරිශුද්ධ සේම මුලුමනින්ම පාපයෙන් තොර අය වෙනවා. පරමාත්ම පියා විසින් දෙන ශ්‍රීමත් ඔබ පිළිපැදිය යුතුයි. මේ ගැන තවත් සිතීමට දෙයක් නැහැ. පළමුවෙන්ම, අපිරිසිදු බවින් පාරිශුද්ධ වන්න මිනිස්සු කන්නලව් කරනවා: ඔහෝ පාරිශුද්ධකරුවාණනි, නමුත් ඔවුන්ට කිසිවක් තේරෙන්නේ නැහැ. පාරිශුද්ධකරු කවුදැයි කියාවත් ඔවුන්ට තේරෙන්නේ නැහැ. මෙය අපිරිසිදු ලෝකය වන අතර එය පාරිශුද්ධ ලෝකය වෙනවා. ප්‍රධානම දෙය පාරිශුද්ධ වීමයි. තමන්ව පාරිශුද්ධ කරවන්නේ කවුද කියා ඔවුන්ට තේරෙන්නේ නැහැ. පාරිශුද්ධකරුට කන්නලව් කළත් ඔවුන් අපිරිසිදුයි කියා ඔබ කී විට ඔවුන් කලබල වෙනවා. කිසිම කෙනෙක් තමන් දූෂිත අයෙක් කියා සළකන්නේ නැහැ. ඔවුන් කියන්නේ: සැම කෙනෙක්ම ගෘහවාසී ජීවිත ගත කළා. ලක්ෂ්මී නාරායනටත් දරුවන් සිටියා. එහිදී දරුවන් උපදින්නේ යෝග බලයෙන්. ඔවුන්ට එය අමතක වෙලා. ඒ ලෝකය හඳුන්වන්නේ පාපයෙන් තොර ලෝකයක් කියලයි. එය ශිවාලයාවයි. පරමාත්ම පියා කියනවා: අපිරිසිදු ලෝකයේ එකම එක පිරිසිදු කොනෙක්වත් නැත. මේ පියා, පියා, ගුරුවරයා හා සත්ගුරු වෙනවා. සැම කෙනෙකුටම මුක්තිය දානය කරන්නේ ඔහුයි. වෙනත් තැනක නම් ගුරු නැතිවුණු විට ඔහුගේ ආසනය පිරිමි

දරුවාට හිමි වෙනවා. ඔහු කාවවත් මුක්තියට ගෙන යන්නේ කෙසේද? සෑම කෙනෙකුටම මුක්තිය දානය කරන්නේ එකම එක පියායි. ස්වර්ණමය යුගයේ සිටියේ දේවතාවරුන්ම පමණයි. අන් සෑම ජීවාත්මයක්ම සාම දේශයට ගිහින් සිටීවි. ඔවුන් රාවන රාජ්‍යයෙන් නිදහස් කරලා. පරමාත්ම පියා සෑම කෙනෙක්වම පාරිශුද්ධ කරවා නිවහන වෙතට ගෙන යනවා. කිසිම කෙනෙක් එක් ක්ෂණයකින් පිරිසිදු වන්නේ නැහැ. ඔවුන් දිගින් දිගටම පහළටම ඇද වැටෙනවා. සතෝප්‍රධාන්ව සිට ඔවුන් සතෝ, රජෝ හා තමෝ මට්ටම් පසුකර යනවා. උපත් 84 චක්‍රය දැන් ඔබගේ සිහියේ තිබෙනවා. ඔබලා දැන් ආලෝක කුළුණු වගේයි. මෙම කල්පයේ ඥානය දැන් ඔබ අවබෝධ කරගෙන තිබෙනවා. මෙම චක්‍රය කරකැවෙන්නේ කෙසේද කියා ඔබ දැන් තේරුම් ගෙන සිටිනවා. ඔය දරුවන් දැන් සෑම කෙනෙකුටම මාවත පෙන්විය යුතුයි. සෑම කෙනෙක්ම බෝට්ටුයි. සෑම කෙනෙක්ටම මාවත පෙන්වන නියමුවන් ඔබලායි. සෑම කෙනෙක්ටම කියන්න: ශාන්ත දේශයත් සතුටු දේශයත් සිහි කර කලි යුගය, දුක් දේශය අමතක කර දමන්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ජීවත්ව සිටිනාතාක් කල් මෙම ඥාන අමෘතය පානය කරන්න. ඔබගේ ඒප්‍රන ඥාන මිණිමුතු වලින් පුරවා ගන්න. ගැටළු ඇති කරගෙන ප්‍රශ්න නඟන්න එපා.
2. ජීවාත්ම සීතාව යෝග අග්නියෙන් පාරිශුද්ධ කර දමන්න. කිසිම දෙයක් සම්බන්ධයෙන් වැඩියෙන් නොයා ජීවාත්ම අවධානයට පත් වීමට උත්සාහ දරන්න. ශාන්ත දේශයත් සතුටු දේශයත් සිහි කරන්න.

**වරදානය:** මෙම දැනුම නිරන්තරයෙන් මතගෑමෙන් ඔබ අත්දැකීම් වල ප්‍රතිමූර්තියක් වී සාගරයේ ගැලුණු අවධිය අත්විඳිත්වා.

ඔබේ අත්දැකීම් වැඩි කිරීමේ පදනම ඔබේ මතගෑමේ බලයයි. මෙම ඥානය මතගාන අය නිරායාසයෙන්ම ගැලී සිටිති. ගැලී සිටීමේ මෙම අවධියේදී, ඔබ යෝගා කිරීමට උත්සාහ කළ යුතු නැත, නමුත් ඔබේ යෝගාව නිරන්තරව සම්බන්ධව ඇත. "ගැලී සිටීම" යන්නෙන් අදහස් කරන්නේ සෙනහස සයුරේ ඒකාබද්ධ වීමයි, කිසිවෙකුට ඔබව වෙන් කළ නොහැකි ආකාරයෙන් ඒකාබද්ධ වීමයි. එබැවින් වෙහෙස වී වැඩ කිරීමෙන් නිදහස් වන්න. ඔබ සාගරයේ දරුවන් වන බැවින් අත්දැකීම් පොකුණක ස්නානය නොකරන්න, නමුත් සාගරයේ ඒකාබද්ධ වන්න, එවිට ඔබ අත්දැකීම්වල ප්‍රතිමූර්තියක් යැයි කියනු ලැබේ.

**පාඨය:** මෙම දැනුමේ ප්‍රතිමූර්තියක් වන ජීවාත්මයකගේ සෑම සිතිවිල්ලක්ම සහ තත්පරයක්ම බලවත්ය.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

ස්වභාවයේ, සංස්කාර වල, පුද්ගලයාගේ හෝ ද්‍රව්‍යමය සැප පහසුව යන ඕනෑම ආකාරයක බන්ධනයක් ඔබව ආකර්ෂණය කරන්නේ නම්, පරමාත්ම පියාගේ ස්මරණයේ නිරන්තරව සිටිය නොහැක. කර්මාතීත් බවට පත්වීම යනු සියලු බන්ධන වලින් නිදහස් වී නොබැඳිව නමට පමණක් පදාර්ථය හරහා ක්‍රියා කිරීමයි. නොබැඳිව සිටීමේ මෙම උත්සාහය නැවත නැවතත් දිගටම කරගෙන යන්න. එය කරන තැනැත්තා එය කිරීමට හැකියාව ලබා දෙන තැනැත්තාගෙන් වෙන්ව සිටින බව ස්වභාවිකව සහ පහසුවෙන් අත්විඳින්න.